# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,592 - 2009 මාර්තු මස 06 වැනි සිකුරාදා - 2009.03.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 268 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 269 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මාර්තු මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 පෙබරවාරි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02 .ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 අප්‍රේල් මස 06 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 පෙබරවාරි මස 11 වැනි දින,
234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| රත්නපුර | ගොඩකවෙල | රත්නපුර දිස්ත්‍රික්කයේ නියන්ගම කොට්ඨාසයේ උප්පැන්න මරණ හා අටකලන් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය/උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

03-30

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ සහ සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර ආදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 අප්‍රේල් මස 06 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 03 වැනි දින,
234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| 01 කළුතර | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල නගර කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් |

03-76

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නන්ගේ ප්‍රවීණතා සහතිකය සඳහා වූ පරීක්ෂණය

*ප්‍රවීණතා සහතිකයේ වර්ග* :

(අ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නකුගේ උසස් පන්තියේ ප්‍රවීණතා සහතිකය,
(ආ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ සාමාන්‍ය පන්තියේ ප්‍රවීණතා සහතිකය,
(ඇ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ පන්තියේ නවක පන්තිය

2. *ඇතුළත් වීම සඳහා අවම අවශ්‍යතා* .- විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයකුටම පහත දැක්වෙන අවම මූලික සුදුසුකම් තිබිය යුතුය.

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අපේක්ෂකයින්ගේ වයස අවුරුදු දාහතර (14) හෝ ඊට වැඩි හෝ විය යුතුය.

3. *පරීක්ෂණයේ පටිපාටි*.- (අ) උසස් පන්තිය - පරීක්ෂණය කොටස් දෙකකින් (2) සමන්විත වේ.

1 වැනි කොටස

පරීක්ෂණයකට පෙනී සිටින එක් වරකදී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතුය.

*I වැනි ප්‍රශ්න පත්‍රය*.- උසස් විදුලි තාක්ෂණය සහ ගුවන් විදුලි සන්නිවේදන (පැය 03)

*II වැනි ප්‍රශ්න පත්‍රය* .- බලපත්‍ර දීමේ කොන්දේසි, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 02)

*2 වැනි කොටස*

ප්‍රායෝගික මෝස් සංඥා පරීක්ෂණය (විනාඩියකට වචන 05යි)

*(ආ) සාමාන්‍ය පන්තිය* - එක් වරකදී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතුය

*I වැනි ප්‍රශ්න පත්‍රය* - ගුවන් විදුලි සන්නිවේදනය සහ විදුලි ශිල්පය පිළිබඳ මූලික කරුණු (පැය 02)

*II වැනි ප්‍රශ්න පත්‍රය* - බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 1)

*(ඇ) නවක පන්තිය* - එක් වරකදී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට (2) උත්තර ලිවිය යුතුය.

*I වැනි ප්‍රශ්න පත්‍රය* - මූලික විදුලි ශිල්පය, ගුවන් විදුලි සහ විද්‍යුත් සිද්ධාන්ත (පැය 02)

*II වැනි ප්‍රශ්න පත්‍රය* - බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01)

4. *පරීක්ෂණයේ කොන්දේසි*.- සියළුම වර්ගවල ප්‍රවීණතා සහතික සම්බන්ධයෙන් පහත දැක්වෙන කොන්දේසි බලපානු ඇත.

(i) අපේක්ෂකයින් පරීක්ෂණයෙන් සමත්වීමට (පරීක්ෂණයේ සියළුම කොටස්වලින් සමත්විය යුතුය.);

(ii) පරීක්ෂණයේ දී 1 වැනි කොටස එක් වාරයකින්ම සමත් විය යුතුයි;

(iii) පරීක්ෂණයේ දී 1 වැනි කොටසින් සමත්වන අපේක්ෂකයින්ට පමණක් උසස් පන්තිය වෙනුවෙන් 2 වැනි කොටසට පෙනී සිටීමට (මෝස් පරීක්ෂණයට ) ඉඩ දෙනු ලැබේ.

5. *පෙනී සිටින මාධ්‍යය.-* විභාගය පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

6. *විභාග ගාස්තු .-* මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන්නා වූ ඉල්ලුම්කරු විසින් නිවේදනයේ දක්වා ඇති පරිදි විභාග ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අමතන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

*පරීක්ෂණ ගාස්තු.-* ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නමට මුදල් ඇණවුමකින් හෝ ඕනෑම බැංකුවකින් අණකරයක් මගින් ගෙවිය යුතුය.

ඇතුළත්වීම සඳහා ඉල්ලුම්පත් ලේඛන ගතකොට භාරදීමෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවිය යුතුය. ඇතුළත්වීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය තැපැල්කළ බවට හෝ භාරදුන් බවට හෝ සාක්ෂි ඉදිරිපත් කළහොත් මිස එය තැපැල් කළ බවට, නැතහොත් භාරදුන් බවට කරන හිමිකම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සළකා බලනු නොලබන හෙයින් නිල කුවිතාන්සිය තමන් ළඟ තබාගත යුතු ය.

පරීක්ෂණ ගාස්තු ආපසු නොගෙවන අතර, පසු දිනක පවත්වනු ලබන වෙනත් පරීක්ෂණයකට පවරනු ලැබිය නොහැකිය. ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා වූ හෝ මොනයම් හේතුවක් නිසා හෝ පරීක්ෂණයකට පෙනී සිටීමට නොහැකි වන්නා වූ හෝ ඕනෑම අපේක්ෂකයකු පසුව පවත්වනු ලබන පරීක්ෂණ සඳහා අදාළ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතුය.

| *පරීක්ෂණයේ වර්ගය* | *1 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* | *2 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* |
|---|---|---|
| උසස් පන්තිය | 276 | 138 |
| සාමාන්‍ය පන්තිය | 138 | - |
| නවක පන්තිය (අ) | 138 | - |
| නවක පන්තිය (ආ) | 138 | - |

7. *අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.-* සෑම අවුරුද්දකටම තුන් වතාවක් පෙබරවාරි, ජූනි සහ ඔක්තෝබර් මාසවල පරීක්ෂණය පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය, විභාග කොමසාරිස්තුමා විසින් දන්වනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගත් නිසි ඇතුළත් වීමේ ආකෘතියෙහි ඉල්ලුම්පත් ඇතුලත්වීමේ අවසාන දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්, අංක 276, ඇල්විටිගල මාවත, මැනිං ටවුන්, කොළඹ 08.

| *සහතිකයේ වර්ගය* | *ඇතුළත්වීමේ අවසාන දිනය* |
|---|---|
| උසස් පන්තිය<br>සාමාන්‍ය පන්තිය<br>නවක පන්තිය | 2009.04.18 |

8. *සහතික කිරීම.-* පහත සඳහන් අයගෙන් කෙනෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කර තිබිය යුතුය.

සාමදාන විනිශ්වයකාරවරයෙක්, දිවුරුම් කොමසාරිස්වරයෙක්, නීතිඥවරයෙක් සහ නොතාරිස්වරයෙක්, යුද්ධ හමුදාවේ හෝ නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධරයෙක්, පොලිසියේ රාජ්‍ය නිවේදිත (ගැසට් කළ) නිලධරයෙක්, වර්ෂයකට රු. 493,920 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන තැනැත්තෙක්.

අනිකුත් සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. *අපේක්ෂකයින් හඳුනා ගැනීම.-* පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීමට අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට සිදුවන අතර මේ කාර්යය සඳහා පහත දැක්වෙන ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(අ) තැපැල්පතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් ;
(ආ) වලංගු ගමන් බලපත්‍රයක් ;
(ඇ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රයක්.

1968 අංක 25 දරන විභාග පනතේ විධිවිධානවලට අනුකූලව සියළුම අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

මෙම නීති සහ නියෝග යටතේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වේ නම් එය විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි නිරාකරණය වන්නේය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්.

2009 ජනවාරි මස 29 වැනි දින,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
මැනිං ටවුන්,
කොළඹ 08.

03-89

---

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වන පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වන පංතියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2009 ජූනි මස, නගර අංක 1 කොළඹ දී සහ නගර අංක 2 යාපනයේ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2009 අප්‍රේල් මස 03 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය .-* මෙම කර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

| | | |
|---|---|---|
| (1) | ක්‍රමසම්පාදන සංකල්පයක්, විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන, මූල්‍ය හා පරිපාලනය | ලකුණු 100යි (විෂය අංකය 1) |
| (2) | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | ලකුණු 100යි (විෂය අංකය 2) |
| (3) | ව්‍යාපෘති සැලසුම් කිරීම | ලකුණු 100යි (විෂය අංකය 3) |
| (4) | ඉංග්‍රීසි භාෂාව | ලකුණු 100යි (විෂය අංකය 4) |

සටහන :

(අ) සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.
(ආ) සාමාර්ථ්‍ය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින් ම ලකුණු 40% අපේක්ෂකයකු විසින් ලබාගත යුතු වේ.
(ඇ) සෑම ප්‍රශ්ණ පත්‍රයක් සඳහාම කාලය පැය 3 කි.

03. විෂයයන් :

(I) ක්‍රමසම්පාදන සංකල්පයක් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන, මූල්‍ය හා පරිපාලනය:

පළමුවන කොටස :

(අ) ජාතික පරමාර්ථයන් හා ප්‍රමුඛත්වයන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ වැඩ සටහන්.

(ආ) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහි ලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම, රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය භාරය ආදිය.

(ඇ) ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපනය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණය හා විමර්ශන ජනවිකාශ සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ

දෙවන කොටස :

(අ) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි, I වැනි කාණ්ඩය ( X වැනි පරිච්ඡේදය හැර).

(ආ) ප්‍රවර්ථන වර්ෂයේ ඇස්තමේන්තු, උදා.- ආදායම් ශිර්ෂ හා වැඩ සටහන් යටතේ ඒවා සකස් කිරීම, මූල්‍ය ක්‍රම හා විසර්ජන පනත් සහ පරිපූරක ඇස්තමේන්තු.

(ඇ) කාර්යාල සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම.

(ඈ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V, VI, VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX,XXXI, XXXII, XXXIII, XLVII, XLVIII.

(II) ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය :

(i) නිපැයුම හා බෙදා හැරීම පිළිබඳ න්‍යායන් කෙරෙහි විශේෂ සැළකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූල ධර්ම
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළඳාම
(iii) මූල්‍ය, මුදල්, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය
(v) ආර්ථිකය සමාලෝචනය කිරීම
(vi) ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගිකරණය
(vii) ආර්ථික, විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි
(viii) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහි ලා උපයෝගි කර ගන්නා මූලික සංඛ්‍යාති සංකල්ප හා ක්‍රම
(ix) ප්‍රතිලාභ/පිරිවැය විශ්ලේෂණ මූලධර්ම

(III) ව්‍යාපෘති සැලසුම් කිරීම :

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනාගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය.

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති සහ වැඩ සටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරි සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, විපරම සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩ සටහන්වල සාපල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය.

(IV) ඉංග්‍රීසි භාෂාව :

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරියකුට සිය රාජකාරි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ඉංග්‍රීසි දැනුම මැනීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.

04. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කරගත යුතු ය. අයදුම් පත්‍රය පිළියෙල කරගත යුත්තේ ඒ4 ප්‍රමාණයේ කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයේ කඩදාසියක නොවේ. අංක 01 සිට 07 දක්වා මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ ද පිළියෙල කරගත යුතුය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. තව ද ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

05. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්) 2009 අප්‍රේල් මස 03 දින හෝ ඊට පෙර, බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාග සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශක නිලධාරින් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

06. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනවා ඇත. අපේක්ෂකයන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතරකටවත් පෙර ප්‍රවේශ පත්‍රයක් නොලැබුනහොත් ඒ බැව් පහත සඳහන් විස්තර සමග බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් (විදුලි පිණිවුඩ ලිපිනය: විභාග බත්තරමුල්ල) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතු ය. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත:

(i) විභාගයේ නම,
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම,
(iii) සම්පූර්ණ ලිපිනය,
(iv) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ දිනය.

07. *අනන්‍යතාවය* -

අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් එකක් පමණක් භාර ගැනේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු හැඳින්වීමේ බලපත්‍රයක්,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු* :-

මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ:

| | *විභාග ගාස්තු* : | *රු. ශ.* |
|---|---|---|
| (අ) | පළමු වන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ | |
| (ආ) | පළමු වන වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 115 0 |
| (ඇ) | එක් විෂයයක් සඳහා | 75 0 |

අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 4000-20-03-20-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ, එහි දාරයක් නොගැලවෙන සේ අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහා ද බල පැවැත්වේ.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

එස්. අබේසිංහ,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

අයදුම් පත්‍රය

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008**

*First Efficiency Bar Examination for Officers in Class II Grade II of the Sri Lanka Planning Service - 2008*

[ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය සහ නගර අංකය — නගරය [ ] නගර අංකය [ ]

(නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)

කොළඹ (Colombo)- 1
යාපනය (Jaffna) - 2

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(ඉල්ලුම්කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

01. නම :
1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් - උදා: SILVA B. A
1.2 සම්පූර්ණ නම :————,
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. කාර්යාලීය ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.1 කාර්යාලයීය ලිපිනය :————,
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :————, ස්ත්‍රී - 1, පුරුෂ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය :වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
3.3 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

04. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වන ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————,
(නිත්‍ය වශයෙන් රජාකාරි භාරගත් දිනය සඳහන් කළ යුතුය)

05. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද ? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද ? :————,

06. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————,

07. *ගැසට් නිවේදනයේ* 2 වැනි ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :

| විෂයය | විෂය අංකය |
|---|---|
| ———— | ☐ |
| ———— | ☐ |
| ———— | ☐ |
| ———— | ☐ |

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ?————,

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :

ලදුපතේ දාරයක්,නොගැලවෙන සේ හොඳින් අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන.- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතුය.

***අත්සන සහතික කිරීම***

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක වූ මා පෞද්ගලිකව දන්නා හඳුනන ———— මහතා/මහත්මිය/මෙනවිය ———— වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————,
පදවි නාමය :————,
ලිපිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————,
දිනය :————,

03-94

---

## ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත තරග විභාගය II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම - 2007(2009)

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, එහි ඉදිරියෙන් දක්වා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට අයත් පුරප්පාඩු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙයට යා කර ඇති ආදර්ශ ආකෘතිය අනුව අංක 1 සිට 6 දක්වා මුල් පිටුවේ දැක්වෙන අයුරු අඟල් 8 1/2 **x** 12 (**A**4) ප්‍රමාණයට පිළියෙල කරන ලද අයදුම්පත් 2009 අප්‍රේල් මස 03 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් ඉහළ කෙලවරෙහි "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා වන විභාගය - 2007 (2009)" යනුවෙන් පැහැදිලිව දැක්විය යුතුය.

ඒ ඒ තනතුරු සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර, තම ඉල්ලුම් පත්‍රයේ, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අයදුම් කෙරෙන තනතුරු අනු පිළිවෙලින් සටහන් කළ යුතුය. නිදසුනක් වශයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ජීව රසඥ, කීට විද්‍යාඥ, ආදී තනතුරුවලට අයදුම් කිරීමට අපේක්ෂා කරන්නකු අදාළ තනතුරුවල සංකේත අංක 1013, 1015 ආදී වශයෙන් අයදුම්පත්‍රයේ 6 වැනි ඡේදයේ "සංකේත අංකය" යන තීරුවේ දැක්විය යුතුය:

| | *පුරප්පාඩු තනතුරු* | *සංකේත අංකය* |
|---|---|---|
| 01 | ඖෂධ විශ්ලේෂක (රසායනික) | 1011 |
| 02 | ඖෂධ විශ්ලේෂක (ජීව විද්‍යාත්මක) | 1012 |
| 03 | ජීව රසඥ | 1013 |
| 04 | භෞතික විද්‍යාඥ | 1014 |
| 05 | කීට විද්‍යාඥ | 1015 |
| 06 | පර්යේෂණ නිලධාරි (ස්වභාවික නිෂ්පාදන රසායන විද්‍යාව) | 1016 |
| 07 | පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා) | 1017 |
| 08 | පර්යේෂණ නිලධාරි (එන්නත් හා නිෂ්පාදන) | 1018 |
| 09 | පර්යේෂණ නිලධාරි ක්ෂුද්‍ර ජීව විද්‍යාව(බැක්ටීරියාවේදී හා වෛරස්වේදී) | 1019 |
| 10 | පර්යේෂණ නිලධාරි (ජීව රසායන) | 1020 |

2. *සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුයි. පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වනු ඇත.
(iii) රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 509/7 සහ 1988 ජුනි මස 07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන ද යටතේ තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.
(iv) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ඉඩ ඇත.

3. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :*

I වන පන්තිය - රු. 36,755 - 17 **x** 1,050 - රු. 53,555,
II වන පන්තිය - රු. 30,175 - 8 **x** 790 - රු. 35,705,
III වන පන්තිය - රු 22,935 - 10 **x** 645 - රු. 29,385.

(පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම ද පත්වීමේ දින සිට වසර 06 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම ද රා. පරි. ච. 20/2001 අනුව සමත් විය යුතු වේ.)

*සටහන :-*
(i) *පළමුවන කාර්යක්ෂමතා කඩඉම :*
පහත සඳහන් විෂයයන් ඇතුළත් පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(*අ*) මූල්‍ය ක්‍රම
(*ආ*) පරිපාලනය
(*ඇ*) දෙපාර්තමේන්තු රෙගුලාසි

(ii) දෙවන කාර්යක්ෂමතා කඩඉම :
අදාළ බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් අයුරු එම්. එස්. සී./එම්. ෆිල් හෝ පී. එච්. ඩී වැනි පශ්චාත් උපාධියකින් සමත් විය යුතුය.

4. *තනතුරු සඳහා අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,
4.2 විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත වීම,
4.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර අයදුම්කරුවන් වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි. (මෙම නිවේදනයේ සඳහන් පරිදි අදාළ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.),
4.4 පහත සඳහන් අදාළ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට සපුරා තිබිය යුතුය.

| *වෘත්තීය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|
| 01. ඖෂධ විශ්ලේෂක (රසායනික) | (*අ*) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා තිබිය යුතුයි; හෝ<br>(*ආ*) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇති විද්‍යාවේදී උපාධියක් සමග පිළිගත් විශ්වවිද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ හෝ ඊට අදාළ විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුයි;<br>හෝ<br>(*ඇ*) ඖෂධ කර්මය (Pharmacy) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුයි ;<br>හෝ<br>(*ඈ*) රාජකීය රසායන විද්‍යා ආයතනයේ හෝ (ශ්‍රී ලංකා) රසායන විද්‍යා ආයතනයේ සාමාජියෙකු විය යුතුය. |

*සටහන :-* රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සාමාන්‍ය විද්‍යා උපාධියක් ද, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් සහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දස අවුරුදු සේවා කාලයක් ඇති ඖෂධවේදීන් සහ වෛද්‍ය රසායානගාර කාර්මික විද්‍යාඥයින් ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. (සතුටුදායක සේවා කාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ සේවා කාලය තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ ද, එම කාලය තුළ කරන ලද වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති ද සේවා කාලයයි.)

02. ඖෂධ විශ්ලේෂක (ජීව විද්‍යාත්මක)

(අ) සත්ත්ව විද්‍යාව හෝ රසායන විද්‍යාව අතිරේක විෂයයක් වශයෙන් ඇතිව රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා තිබිය යුතුයි;

හෝ

(ආ) භෛෂජ්‍යවේදය (Pharmacology) හෝ භෛෂජ කර්මය (Pharmacy) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුයි;

හෝ

(ඇ) භෛෂජ්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධියක් සහිතව විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුයි;

හෝ

(ඈ) සත්ත්ව විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව පළමුවැනි හෝ දෙවැනි පන්තියේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබිය යුතුයි.

සටහන:- රසායන විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව සාමාන්‍ය විද්‍යා උපාධියක් ද, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් සහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දස අවුරුදු සේවා කාලයක් ඇති ඖෂධවේදීන් සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් ද, ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. (සතුටුදායක සේවා කාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ සේවා කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ ද, එම කාලය තුළ කරන ලද වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති ද සේවා කාලයයි.)

03. ජීව රසඥ

(අ) මෙහි පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය. පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව විෂයයෙහි පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක් හෝ ලංඩනයේ හෝ ශ්‍රී ලංකාවේ හෝ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය විද්‍යාලයේ සාමාජිකයෙකු වීම ; හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව විෂයයක් සහිතව සාමාන්‍ය විද්‍යා උපාධියක් සහ රසායන විද්‍යාව විෂයයෙහි පී. එච්. එස්. සී. වැනි පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සටහන :- රසායන විද්‍යාව සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය විද්‍යා උපාධියක් ලබා ඇති අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් සහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දස අවුරුදු සේවා කාලයක් ඇති වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයෝ ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති. (සතුටුදායක සේවා කාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ සේවා කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ ද, එම කාලය තුළ කරන ලද වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති ද සේවා කාලයයි.)

04. භෞතික විද්‍යාඥ

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යා විෂයයෙහි (විශේෂ) ගෞරව උපාධියක් ලබා තිබිය යුතුයි;

නැතහොත්

(ආ) භෞතික විද්‍යා විශේෂ උපාධිය හෝ භෞතික විද්‍යාව විෂයයක් ලෙස විද්‍යාවේදී උපාධියක් හා විකිරණ ශිල්පියෙකු වශයෙන් රජයේ හෝ රජයට අනුබද්ධ ආයතනයක පස් වසරක සේවයක් ඇති නිලධාරියෙකු විය යුතුය.

05. කීට විද්‍යාඥ

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක කීට විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව සත්ත්ව විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබිය යුතුයි;

නැතහොත්

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කීට විද්‍යාව පිළිබඳව (පී. එච්. ඩී/හෝ එම්. එස්. සී./ දර්ශනපති) උපාධිය ලබා තිබිය යුතුයි.

06. පර්යේෂණ නිලධාරි (ස්වාභාවික නිෂ්පාදන රසායන විද්‍යාව)

(අ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ ගෞරව උපාධිය ලබා (පළමුවන හෝ දෙවන පන්තිය) තිබිය යුතුයි;

හෝ

(ආ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය ලබා තිබිය යුතුය. (ස්වාභාවික නිෂ්පාදන රසායන විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඟින්).

07. පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා)

(අ) කීට විද්‍යාව විශේෂ විෂයයක් වශයෙන් ඇතිව සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී පළමුවන හෝ දෙවන පන්තියේ විශේෂ ගෞරව උපාධිය ලබා තිබිය යුතුයි ;
*හෝ*
(සත්ව විද්‍යාව සහිතව) විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය 1 වන පන්තිය හෝ **II** වන පන්තිය සහ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධියක් ලබා තිබිය යුතුයි.

08. පර්යේෂණ නිලධාරි (එන්නත් සහ නිෂ්පාදන)

(අ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ (ගෞරව) උපාධියක් ලබා තිබිය යුතුයි ;
*හෝ*
(ආ) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව සත්ත්ව විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. උපාධියක් ලබා තිබිය යුතුයි ;
*හෝ*
(ඇ) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් පළමුවන හෝ දෙවන පන්තිය සහ (ක්ෂුද්‍ර ජීව වේදය හෝ ජීව රසායන විද්‍යාව සම්බන්ධයෙන් ඇති පශ්චාත් උපාධිය).

09. පර්යේෂණ නිලධාරි ක්ෂුද්‍ර ජීව විද්‍යාව (බැක්ටීරියාවේදී හා වෛරස්වේදී)

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ක්ෂුද්‍ර ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇති උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ පළමුවෙනි හෝ දෙවන පන්තියේ විශේෂ (ගෞරව) උපාධියක් ලබා තිබීම ;
හෝ
(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උද්භිද විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පළමුවන හෝ දෙවන පන්තිය සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව සම්බන්ධයෙන් එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධියක් ලබා තිබීම ;

හෝ
(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් බී. එස්. සී. උපාධිය පළමුවන හෝ දෙවන පන්තිය සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව සම්බන්ධයෙන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම.

10. පර්යේෂණ නිලධාරි (ජීව රසායන)

(අ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ (ගෞරව) පළමුවන හෝ දෙවන පන්තිය උපාධියක් ලබා තිබීම;
හෝ
(ආ) ශායනික රසායන විද්‍යාව සම්බන්ධයෙන් එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය සහිතව විද්‍යාවේදී විශේෂ (ගෞරව) උපාධියක් ලබා තිබීම; හෝ
(ඇ) (රසායන විද්‍යාව සහිතව) විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හා ශායනික ජීව රසායන විද්‍යාව සම්බන්ධයෙන් එම්. එෆ්. බී. උපාධියක් ලබා තිබීම.

*සටහන :-*

(I) සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිල සහතිකය හෝ එම සහතිකය වෙනුවට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් පිළිගන්නා වූ නිල ලේඛනයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇත්නම්, පමණක් විද්‍යාත්මක සේවයේ පත්වීමක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් ලබා ඇති බැව් සලකනු ලැබේ. ඒ අනුව සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින්ට නියම කෙරෙනු ඇත ;

*(අ)* උප්පැන්න සහතිකය (සැ. යු. බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථාවල කාර්යයන් නිකුත් කරන ලද උප්පැන්න සහතික භාර ගනු නොලැබේ.);
*(ආ)* උපාධි සහ උසස්ම අධ්‍යාපනික සහතික;
*(ඇ)* චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන ආයතනයක අධ්‍යක්ෂ/කථිකාචාර්යවරයාගෙන්, විශ්වවිද්‍යාල මහාචාර්යවරයාගෙන් විය යුතුය.)
*(ඈ)* වෘත්තීය පළපුරුද්ද හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික;
*(ඉ)* සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

6. (I) ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, 07 සිට 11 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය 3 වන පිටුවද වන ලෙස ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු අතර, ඉල්ලුම්පත්‍රය අත් අකුරෙන්ම පැහැදිලිවම පිරවිය යුතුයි. අදාර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න.

(ii) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් සඳහන් ඔබගේ ඉල්ලීම ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

7. *විභාග ගාස්තු* -විභාගය සඳහා ගාස්තුව රු. 300 කි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 6 උපශීර්ෂ 1 විෂය 4 උප විෂය 4 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබාගත් ලදුපත ඉල්ලුම් පත්‍රයෙහි අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය කොළඹ දී පවත්වනු ලැබේ.

8. මෙම *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස (**ii** අ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධරයන් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

10. ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන නියමිත පරිදි සහතික කර, ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති රීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

*සටහන* :-

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂියක් ලෙස නොසැලකිය යුතුය.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම් පත්‍රය,
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය).

12. *සාවද්‍ය තොරතුරු සැපයීම* :- අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. *විභාග ක්‍රමය*:- විභාග මාධ්‍යය : (ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

*(අ)* විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
*(ආ)* අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් විභාගයෙන් සාමාර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝරාජ්‍ය භාෂාවකින්ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
*(ඇ)* අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම විභාගයේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදා ගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.
*(ඈ)* ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයන් සාමාර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි සුදුසුකම්ලත් 'විභාගය' යන පදයෙන් අදහස් කරන්නේ මූලික සුදුසුකම්ලත් විභාගය වේ.
(ii) අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.
(iii) තම ඉල්ලුම් පතෙහි සඳහන් විභාග භාෂාව හෝ විෂයයන් හෝ ඒවායේ මට්ටම් හෝ වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.
(iv) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. *බඳවා ගැනීමේ ක්‍රමය*.- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි ඔහු වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල වල කුසලතා අනුපිළිවෙල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශද සලකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් කරනු ලැබේ.

*(අ)* බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 යි. පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි ;
*(ආ)* පොදු ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි . පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.

16. නිර්දේශ පත්‍රිකා :

*බුද්ධි පරීක්ෂණය*.- පැය 01 ක කාලයකට සීමාවෙන මෙය, සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත් ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්න වලින් යුක්ත වනු ඇත.

පොදු ප්‍රශ්න පත්‍රය - මෙය කොටසක් දෙකකින් යුක්තය.

**I** වන කොටස - සියලුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ව්‍යුහගත ප්‍රශ්න වලින් යුක්ත වේ.
**II** වන කොටස - ආර්ථික දේශපාලන සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත වේ.

17. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

18. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ,
කටයුතු අමාත්‍යාංශය.

2009 අප්‍රේල් මස 17 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත තරඟ විභාගය II පන්තියේ II ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම - 2007(2009)**

විභාග අංකය : ☐
(කාර්යාලීය ප්‍රායෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
සිංහල - 2
දෙමළ - 3 (අදාල අංකය කොටුව තුළ ලියන්න)
ඉංග්‍රීසි - 4

අයදුම්කරන තනතුර/තනතුරු :

| *තනතුර* | *සංකේත අංකය* |
|---|---|
| | |

01. ඉල්ලුම්කරුගේ නම :————.
1 : 01 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න) :————.
1 : 02 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.
1 : 03 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරන් සඳහන් කරන්න) :————.

02. ලිපිනය :————.
2.01 ප්‍රවේශපත්‍රයක් එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
2.02 රාජකාරි ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. වයස :

5.01 උපන් දිනය: වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය : ☐☐

5.02 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : ☐

අවිවාහක -1 /විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. සුදුසුකම් :————.

7.01 අධ්‍යාපන සුදුසුකම් :————.

සමත් වූ විභාගය/උපාධිය, පන්තිය, විෂයන් සහ විශ්ව විද්‍යාල/ආයතන සඳහන් කරන්න.

| *විභාගය/උපාධිය* | *පන්තිය* | *වර්ෂය* | *විෂයයන්* | *විශ්ව විද්‍යාල/ආයතන* |
|---|---|---|---|---|
| | | | | |

7.02 වෘත්තීය සුදුසුකම් :————.

08. සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගය :————.
1. සිංහල :————.
2. දෙමළ :————.
3. ඉංග්‍රීසි :————.

09. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ /හෝ ලැබූ පුහුණුව පිළිබඳ විස්තර (සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය) :————.

10. දැනට දරන තනතුරේ විස්තර :

*(අ)* තනතුර :————.
*(ආ)* දෙපාර්තමේන්තුව/ආයතනය :————.
*(ඇ)* පත්වීමේ දිනය :————.
*(ඈ)* ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලිකද යන වග :————.
*(ඉ)* තනතුර ස්ථිර කර තිබේද යන වග :————.
*(ඊ)* තනතුරේ වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :————.

11. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න.:———.

12. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මනා ලෙස අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් තමන් වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)
කුවිතාන්සි අංකය :————.
ගෙවන ලද කාර්යාලය :————. ☐
දිනය :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය බව ද, නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් පනවනු ලබන ඇති සියළුම නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

*ඉල්ලුම්කරු රජයේ සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව*

ඉහත 12 වැනි ඡේදයේ දී ඇති විස්තර නිවැරදි බවත්/පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම................................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

—————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

තනතුර:—————.
දිනය :—————.

03-68

---

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු (පිරිමි හා කාන්තා)

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පිරිමි සහ කාන්තා උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවාගන්නා ලදුව උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිමකිරීමට සමත් වන ශිෂ්‍යභට නිලධාරින්ට ආරක්ෂක අධ්‍යයන උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් කලා, වාණිජ සහ කළමනාකරණ හා කාර්මික විද්‍යා, පාඨමාලා කාලසීමාව අවුරුදු තුනක් වන අතර, ඉංජිනේරු පාඨමාලාව අවුරුදු තුනහමාරකි.

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍යභට නිලධාරින් හා නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවේ එක් එක් හමුදාව සඳහා අනුයුක්ත කිරීම එම එක් එක් හමුදාවේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවල දී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව ද පදනම් කොට ගෙන සිදුකරනු ඇත. උපාධි පාඨමාලාවේ පළමු වර්ෂ දෙක සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ශිෂ්‍යභට නිලධාරින්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුද හමුදාව, නාවුක හමුදාව හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේනාංකවල අධිකාරිලත් තනතුරුවලට පත් කරනු ලැබේ.

3.2 අවුරුදු තුනක/අවුරුදු තුනහමාරක අධ්‍යයන සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුනට අදාළ පරිදි ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (බී. එස්. සී.) ඉංජිනේරු උපාධිය, විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය, ශාස්ත්‍රවේදී (බී. ඒ.) උපාධිය හෝ වාණිජවේදී (බී. කොම්) උපාධිය පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි ආරක්ෂක විද්‍යා උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය :

(i) පහත දැක්වෙන ක්ෂේත්‍රවලින් එකක් පිළිබඳ විද්‍යාවේදී (බී. එස්. සී.) ඉංජිනේරු උපාධිය (පාඨමාලා කාලසීමාව අවුරුදු තුනහමාරකි).

(අ) සිවිල් ඉංජිනේරු විද්‍යාව
(ආ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
(ඇ) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව
(ඈ) නාවුක ඉංජිනේරු විද්‍යාව
(ඉ) ගුවන් යානා ඉංජිනේරු විද්‍යාව

අ.පො. ස. (උ. පෙළ) පරීක්ෂණයේ දී භෞතික විද්‍යාව විෂයධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟාවූවන් සඳහා

| | | |
|---|---|---|
| (ii)) | විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව (කාලසීමාව අවුරුදු තුනකි) | අ.පො. ස. (උ. පෙළ) විභාගය සඳහා භෞතික විද්‍යා විෂයධාරාව හෝ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම්කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟාවූවන් සඳහා (ජීව විද්‍යා විෂය ධාරාව හදාරා ඇති අපේක්ෂකයින් අ.පො.ස (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් ලෙස හදාරා සිටිය යුතුය) |
| (iii) | වාණිජවේදී (බී. කොම්) උපාධි පාඨමාලාව (කාලසීමාව අවුරුදු තුනකි) | අ.පො. ස. (උ. පෙළ) විභාගය සඳහා වාණිජ විද්‍යා විෂයධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟාවූවන් සඳහා |
| (iv) | ශාස්ත්‍රවේදී (බී. ඒ.) උපාධි පාඨමාලාව (කාලසීමාව අවුරුදු තුනකි) | අ.පො. ස. (උ. පෙළ) විභාගයේ දී, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය, දේශපාලන විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව (විෂය අංක 73), හා ගණිතය (විෂය අංක 07) යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සහිතව කලා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟාවූවන් සඳහා) |

3.5 යම්කිසි උපාධි පාඨමාලාවකට තෝරාගනු ලබන ශිෂ්‍යභට නිලධාරියෙකු/නිලධාරිනියක එම පාඨමාලාවට අයිති පොදු විෂයයන්ට අමතරව ඉංග්‍රීසි, කළමනාකරණ නීතිය, අන්තර්ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන් ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩව පුහුණුවීම් වල යෙදිය යුතුය.

04. *ශිෂ්‍යභට නිලධාරි/නිලධාරිනි තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් :-*
(අවශ්‍ය සියළු සුදුසුකම් 2009 අප්‍රේල් 03 වන දිනට සපුරා තිබිය යුතුය).

*අයදුම්කරුවන් :-*

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(*ආ*) 2009 අප්‍රේල් මස 03 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතුයි.

*අධ්‍යාපන සුදුසුකම් :-*

(*ඇ*) විභාග කොමසාරිස් ජෙනරාල් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට සහතික කොට ඇති පහත සඳහන් සුදුසුකම් සපුරාලූ අයහට ඉල්ලුම් කළ හැක.

(i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට නව නිර්දේශ යටතේ පෙනී සිට -

(*අ*) අනුමත විෂයයන් තුනටම (03) අවම වශයෙන් සාමාන්‍ය (එස්) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(*ආ*) පොදු සාමාන්‍ය ප්‍රශ්නපත්‍රයෙන් ද විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා සමත්ව සිටිය යුතුය.

(විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට විභාග කොමසාරිස් ජෙනරාල්/විදුහල්පති විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයක ඡායා පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය).

(ii) අවම වශයෙන් අ.පො.ස(සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (සී) සාමාර්ථයක් ලබා සිටිය යුතුයි.

(*ඈ*) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතුය :

| | | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| *උස* :- | යුද හමුදාව සඳහා | - සෙ. මී. 165. 1(5" 5") | සෙ.මී. 152.4 (5' 0") |
| | නාවික හමුදාව සඳහා | - සෙ. මී. 167.6 (5" 6") | - |
| | ගුවන් හමුදාව සඳහා | - සෙ. මී. 167.6 (5" 6") | සෙ. මී. 160.0 (5' 3") |
| | බර | - කිලෝ ග්‍රෑම් 50 (රා. 110) | |
| | පපුව | - සෙ. මී. 81.25 (32") (ප්‍රශ්වාස) | |

*සටහන*.- ක්‍රීඩා හෝ වෙනත් අදාල විෂයයන්හි විශේෂ කෞශල්‍යයක් දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් මහජන ආරක්ෂාව, නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සභාපතිගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු වේ. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුතුයි.

(ඊ) අවිවාහකයෙකු විය යුතු වේ. (උපාධි අපේක්ෂක ශිෂ්‍ය භටයෙකුට හෝ නිලධාරියෙකුට/නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළ දී විවාහවීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහවීමට අවසර දෙනු නොලැබේ.).

5. *සේවා කොන්දේසි.-* තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යභට නිලධාරින් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ට ද අනුකූලව පනවන ලද්දා වූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අවම වශයෙන් අවුරුදු 10 හෝ 12 ක කාලසීමාවක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයන්ට ශිෂ්‍යභට නිලධාරියෙකුට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක ශිෂ්‍යභට නිලධාරියෙකුගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 1,80,240 ක් වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද සැලැස්වේ :

(i) ආහාර හා නවාතැන් ;
(ii) වෛද්‍ය පහසුකම් ;
(iii) නිල ඇඳුම් ;
(iv) අනුගාමික සේවාවන් ;
(v) ක්‍රීඩා හා විනෝද පහසුකම් ;

8. ශ්‍රී ලංකා යුද හමුදාව, නාවුක හමුදාව හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි අදාළ සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනාවලට හිමිකම ලබනු ඇත.

(අ) ලුතිනන් කර්නල්/කොමාන්ඩර්/ විංග් කොමාන්ඩර් නිලය දක්වා නිලධාරීන්ට දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණ පහත දැක්වේ :

2/ලුතිනන්/වැඩ බලන උප ලුතිනන්/නියමු නිලධාරි - වර්ෂයකට රු. 1,89,240

ලුතිනන්/උපලුතිනන්/පියාසර නිලධාරී
වර්ෂයකට රු. 2,75,220 - 30 **x** 7,740 - 5,07,420

කපිතන්/ලුතිනන්/පියාසර ලුතිනන්
වර්ෂයකට රු. 3,21,660 -24 **x** 7,740 -5,07,420

මේජර්/ලුතිනන් කොමාන්ඩර්/බලසෙණාධිපති
වර්ෂයකට රු. 3,52,620 - 20 **x** 7,740 - 5,07,420

ලුතිනන් කර්නල්/කොමාන්ඩර්/විංග් කොමාන්ඩර්
වර්ෂයකට රු. 3,62,100 - 15 **x** 9,480 - 5,04,300

(ආ) පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ :

(i) සුදුසුකම් දීමනා ;
(ii) ආහාර දීමනාව ;
(iii) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් ;
(විවාහක නිලධාරීන්ට පමණක්) ;
(iv) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

(ඇ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ :

(i) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නේවාසික පහසුකම් ;
(ii) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී ;
(iii) නිල ඇඳුම් දීමනා ;
(iv) විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය ;
(v) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපත්‍රක්.

9. ශ්‍රී ලංකා යුද, නාවුක සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත :

(අ) යුද හමුදා/නාවුක හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය ;
(ආ) යුද හමුදා/නාවුක හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන වලංගු රෙගුලාසි ;
(ඇ) ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළකරන වලංගු යුද හමුදා/ නාවුක හමුදා/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය.

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සේනාවිධායක සහ /හෝ අදාළ හමුදාපතිත් විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැක.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13. *භාෂා අවශ්‍යතා.-* තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූද, ඉදිරියේදී පනවනු ලැබිය හැකි වූද, නීතීන්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.-* අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. *අයදුම්පත්.-* උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තුවන්නන් විසින් දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව තමන් විසින්ම පිළියෙල කරගත් අයදුම්පත් එවිය හැකිය. නැතහොත් තම ලිපිනය ලියූ රුපියල් පහ (රු. 5) ක් වටිනා මුද්දර අලවන ලද, (9" **x** 4" ප්‍රමාණයේ) ලියුම් කවරයක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ "ලේඛකාධිකාරී" වෙත එවීමෙන් හෝ විශ්ව විද්‍යාල වෙබ් අඩවිය **www.kdu.lk** වෙතින් අදාළ අයදුම් පත්‍රය හා වැඩි දුර විස්තර අඩංගු පත්‍රිකාව ලබාගෙන අයදුම් කළ හැකියි.

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේදී දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල් සියයක (රු.100) මුදලක් "සේනාවිධායක, කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය" නමින් ලංකා බැංකුවේ "මොරටුව - ඉඩම" ශාඛාවේ අංක "681950" ගිණුමට බැරකර, ඔබවෙත ලැබෙන ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසි වලට අනුකූල නොවන හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත එවීමේ දී ගෙවනු ලැබූ, මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ක්‍රි. ව. 2009 අප්‍රේල් මස 03 වෙනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය, කඳවලවත්ත, රත්මලාන". යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ශිෂ්‍යභට තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බවට එම ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

19. උප්පැන්න සහතිකය සහ අධ්‍යාපන සහතිකවල ඡායාපිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටීම අවශ්‍ය වන්නේ ය.

21. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරන්නට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

23. අයදුම්පත් ලද බැව් දන්වනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
මහජන ආරක්ෂාව නීතිය හා
සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සහ
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
පාලක මණ්ඩලයේ සභාපති.

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය

*උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා අයදුම්පත්‍රය*

ජාතික හැඳුනුම්පත් අංකය :—————.

01. (අ) සම්පූර්ණ නම :—————.
(ආ) මුලකුරු සමග නම :—————.

02. (අ) ලිපිනය :—————. දුරකථන අංකය :—————.

03. උපන් දිනය :

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

04. 2009 අප්‍රේල් 03 වෙනි දිනට වයස :

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| | | |

05. විවාහක/අවිවාහක බව :

| විවාහක | අවිවාහක |
|---|---|
| | |

06. ස්ත්‍රී පුරුෂ භාවය :

| පුරුෂ | ස්ත්‍රී |
|---|---|
| | |

07. ශ්‍රී ලාංකික පුරවැසි භාවය :

| උපතින් | ලියාපදිංචි වීමෙන් |
|---|---|
| | |

08.අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා. පෙ.) පරීක්ෂණය :-
අධ්‍යාපනය ලැබූ විදුහලේ නම :—————.
විභාග අංකය :—————.
අවුරුද්ද :—————.

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 . | ————— | ————— |
| 2 . | ————— | ————— |
| 3 . | ————— | ————— |
| 4 . | ————— | ————— |
| 5 . | ————— | ————— |
| 6 . | ————— | ————— |
| 7 . | ————— | ————— |
| 8 . | ————— | ————— |
| 9 . | ————— | ————— |
| 10 . | ————— | ————— |

(ආ) අ.පො.ස. (උ. පෙ.) පරීක්ෂණය -
අධ්‍යාපනය ලැබූ විදුහලේ නම :—————.
විභාග අංකය :—————.
අවුරුද්ද :—————.
ලබාගත් "Z" ලකුණු සංඛ්‍යාව :—————.

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 . | ————— | ————— |
| 2 . | ————— | ————— |
| 3 . | ————— | ————— |
| 4 . | සාමාන්‍ය පොදු පරීක්ෂණයේ ලකුණු | ————— |

අ.පො.ස.(සා.පෙ) පරීක්‍ෂණයේ දී ඉංග්‍රීසි භාෂාවට ඔබ ලබාගත් ඉහලම සාමාර්ථය : [ ]

විෂය ධාරාව :

| *භෞතික විද්‍යාව* | *ජීව විද්‍යාව* | *වාණිජ* | *කලා* |
|---|---|---|---|
| | | | |

විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ඇතැයි විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් සහතික කර තිබේද ?
(කරුණාකර අදාළ සහතිකයේ පිටපතක් අමුණා එවන්න. )

| ඔව් | නැත |
|---|---|
| | |

09.

| ඔබ නියෝජනය කර ඇති ක්‍රීඩා සළකුණු කරන්න | මට්ටම | | | |
|---|---|---|---|---|
| | පාසල් | දිස්ත්‍රික් | ක්‍රීඩා සමාජ | ජාතික |
| 1 මලල ක්‍රීඩා | | | | |
| 2 බැඩ්මින්ටන් | | | | |
| 3 පැසිපන්දු | | | | |
| 4 ක්‍රිකට් | | | | |
| 5 හොකී | | | | |
| 6 රගර් | | | | |
| 7 පා පන්දු | | | | |
| 8 පිහිනුම් | | | | |
| 9 ටේබල් ටෙනිස් | | | | |
| 10 ටෙනිස් | | | | |
| 11 වොලිබෝල් | | | | |
| 12 මල්ලවපොර | | | | |
| 13 කරාටේ | | | | |
| 14 ජුඩෝ | | | | |
| 15 බොක්සින් | | | | |
| 16 ස්කොෂ් | | | | |

10. බාහිර ක්‍රියාකාරකම් :

| | | |
|---|---|---|
| (අ) | සංගීත කණ්ඩායම | |
| (ආ) | කැඩෙට් | |
| (ඇ) | බාලදක්ෂ | |
| (ඈ) | සමාජ | |
| (ඉ) | ශිෂ්‍යනායක | |
| (ඊ) | නිවාස නායක | |
| (උ) | විදුහලේ නායක | |

11. ශාරීරික මිනුම් ප්‍රමාණ :

| උස | | බර | පපුව (ප්‍රශ්වාස) |
|---|---|---|---|
| අඩි | අඟල් | රාත්තල් | අඟල් |
| | | | |

අදාළ වෙනත් කරුණු :
(අවශ්‍ය නම් වෙනත් කඩදාසියක් ඇමිණිය හැක)

12. ඔබ චරිත සහතික ලබාගත් පුද්ගලයින්ගේ නම් :

| | නම | ලිපිනය | වෘත්තිය | දුරකථන |
|---|---|---|---|---|
| (i) | .............................. | .............................. | .............................. | ........................ |
| (ii) | .............................. | .............................. | .............................. | ........................ |

13. **"සේනාවිධායක/උපකුලපති, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය"** නමින් **"ලංකා බැංකුවේ,මොරටුව - ඉඩම"** ශාඛාවේ අංක **"681950"** ගිණුමට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල් සියයක් (රු.100) බැර කර පහත සඳහන් විස්තර දක්වන්න. (මුදල් ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය.)

(i) මුදල් ගෙවූ දිනය :——————.

(ii) මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාව :——————.

14. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය හා පිළිගැනීම අනුව නිවැරදි හා සත්‍ය බැව් ගෞරවයේ නාමයෙන් ප්‍රකාශ කරමි. මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් දක්වා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බැව් මා තෝරාගැනීමට පෙරාතුව අනාවරණය වුවහොත් මා තෝරා ගැනීම සඳහා නුසුදුස්සෙකු වන බවත් තෝරා ගැනීමට පසුව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියකින් තොරව අස්කිරීමට අවකාශ ඇති බවත් මම දනිමි.

දිනය :——————. ——————.
අයදුම්කරුගේ අත්සන.

03-122

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) තනතුරු***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාව) යටතේ උපලේඛනගත කොට ඇති පහත දැක්වෙන තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සිංහල මාධ්‍ය* | *පුරප්පාඩු දමිළ මාධ්‍ය* | *පුරප්පාඩු ඉංග්‍රීසි මාධ්‍ය* |
|---|---|---|---|---|
| 01. | ඉලෙක්ට්‍රොනික් විද්‍යාව පිළිබඳ උපදේශක | 26 | 07 | - |
| 02. | ගොඩනැගිලි වෘත්තීය පිළිබඳ උපදේශක | 36 | 09 | - |
| 03. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ උපදේශක | 18 | 09 | - |
| 04. | ලී වැඩ පිළිබඳ උපදේශක | 46 | 09 | - |
| 05. | ශීතකරණ හා වායු සමනය පිළිබඳ උපදේශක | 17 | 02 | - |
| 06. | කාර්මික චිත්‍ර පිළිබඳ උපදේශක | 24 | 08 | - |
| 07. | විදුලි වෘත්තීය පිළිබඳ උපදේශක | 08 | 09 | - |
| 08. | ඉංග්‍රීසි පිළිබඳ උපදේශක | - | - | 66 |
| 09. | පරිගණක තාක්ෂණික උපදේශක | 41 | 08 | - |
| 10. | විද්‍යා-ගණිතය උපදේශක | 01 | 01 | - |
| 11. | වාණිජ්‍ය විද්‍යා උපදේශක | 02 | 02 | - |
| 12. | ලෝහවැඩ පිළිබඳ උපදේශක | 08 | 06 | - |

පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2009.03.31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, කොළඹ 10" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරෙහි 'ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාව) තනතුරු' යනුවෙන් සඳහන් කළ යුතුය. එක් තනතුරකට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම් අයදුම්පතේ තමන් තනතුරු තෝරාගන්නා අනුපිළිවෙල අනුව තනතුරු අංක හා තනතුරු නාමයන් සඳහන් කර එවිය යුතුය. ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් ලැබූ අය පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

02. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත වන අතර තෝරාගන්නා අපේක්ෂකයින් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

***කාර්යක්ෂමතා කඩඉම :***

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2001 ට අනුව 04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම ද 07 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතුය. නියමිත කාලය ඇතුළතදී කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වීම වැටුප් වර්ධක විලම්භනය කිරීමට හේතුවන අතර, දී ඇති කාලසීමාට ඉක්මවා ගන්නා කාලය වැටුප් වර්ධක විලම්භනය කෙරෙන කාලසීමාව වශයෙන් සැලකෙනු ඇත. තවද, මෙම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන තෙක් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ කිසිම උසස් තනතුරක් සඳහා අයදුම් කිරීමට ද නුසුදුස්සන් වනු ඇත.

(ඇ) මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳි වසර 05ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය. එසේ එම කාලය තුළ නියමිත භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. මෙම නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීනතාවයන් වනුයේ —

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයයන් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම.

03. **වැටුප් හා දීමනා**

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 22,935-645x10- 790 x8-1,050-17-53,555 වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL-1-2006 වැටුප් ගෙවනු ලැබේ. වැටුප් වර්ධක ගෙවීම ඉහත 02 ඡේදයේ "ආ" හි සඳහන් කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට යටත් වනු ඇත.

04. **අවශ්‍ය සුදුසුකම්**

සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට එක් එක් තනතුරු යටතේ දක්වා ඇති වෘත්තීය (අධ්‍යාපන) සුදුසුකම් ලබා ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බව ;
(ආ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව ;
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 45ට නොවැඩි බව ;
(ඈ) එක් එක් තනතුරු යටතේ දක්වා ඇති පහත දැක්වෙන වෘත්තීය/අධ්‍යාපන සුදුසුකම් හා අදාළ පළපුරුද්ද ලබා ඇති බව.

05. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

05.1 *ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපදේශක*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු - ඉලෙක්ට්‍රොනික්) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ තාක්ෂණිකයින්ගේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගනණකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම ;
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ; සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාල ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.2 *ගොඩනැගිලි වෘත්තීය පිළිබඳ උපදේශක*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (සිවිල් ඉංජිනෙරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ; සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම.
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාල ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීම් සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.3 *මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ උපදේශක*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු - මෝටර් යාන්ත්‍රික විද්‍යාව) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු - මෝටර් යාන්ත්‍රික විද්‍යාව) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන් හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) ; සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ උසස් සුදුසුකම් ;
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ; සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාල ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.4 *ලී වැඩ පිළිබඳ උපදේශක තනතුර*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (සිවිල් ඉංජිනේරු/යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (ආදල ක්ෂේත්‍රයේ) ;සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම.
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) සහ
ඉහත සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාල ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.5 ශීතකරණ හා වායුසමනය පිළිබඳ උපදේශක

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික/නිෂ්පාදන ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු - ශීත කරණ හා වායු සමන) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතික (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) ; සහ
අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම හෝ ;
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම.
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.6 *කාර්මික චිත්‍ර පිළිබඳ උපදේශක*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) ; සහ
අ. පො. ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම්.
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු වසර පහක අදාළ ක්ෂේත්‍රයේ ඉගැන්වීම සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.7 *විදුලි වෘත්තීය පිළිබඳ උපදේශක*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) ; සහ
අ. පො ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ;
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ; සහ
ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

05.8 *ඉංග්‍රීසි භාෂා පිළිබඳ උපදේශක*

(අ)(i) ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය සහ එම සුදුසුකම් ලබාගත් පසු ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ වසර 03ක පළපුරුද්ද.

05.9 පරිගණක තාක්ෂණික උපදේශක

(i) පරිගණක විද්‍යාව/පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ
විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය ; හෝ
(ii) පරිගණක විෂය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය ; හෝ
(iii) පරිගණක විද්‍යාව විෂයය සහිතව පිළගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් ; හෝ
(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය ; හෝ
තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් සහ
ඉහත සුදුසුකම් ලබාගත් පසු පරිගණක තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික වසර තුනක (03) පළපුරුද්ද ; හෝ
(v) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මගින් නිකුත් කරනු ලබන පරිගණක තාක්ෂණය පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා සහතිකය ; හෝ
(vi) සමාන හෝ උසස් සුදුසුකම්
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) සහ
ඉහත සුදුසුකම් ලබාගත් පසු පරිගණක තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ හා/හෝ වසර පහක (05) පළපුරුද්ද.

05.10 *විද්‍යා හා ගණිත උපදේශක :*

(i) භෞතික විද්‍යාව හා ගණිතය (ශුද්ධ ගණිතය හෝ ව්‍යාවහාරික ගණිතය) විෂයයන් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; සහ
උපාධිය ලබාගත් පසු ඉගැන්වීම පිළිබඳ වසර 03ක පළපුරුද්ද.

05.11 *වාණිජ්‍ය විද්‍යා උපදේශක :*

(i) ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය හෝ වාණිජ්‍ය විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා තිබීම; හෝ
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාලයකින්/ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් වාණිජ්‍ය විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම; හෝ
සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්); සහ
සුදුසුකම් ලැබූ පසු අදාල ක්ෂේත්‍රයේ/ඉගැන්වීමේ අවුරුදු 03ක පළපුරුද්ද.

05.12 *ලෝහ වැඩ පිළිබඳ උපදේශක :*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iii) ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ
(iv) ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාල ක්ෂේත්‍රයේ) ; සහ
අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ; හෝ
(v) අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම.
(රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්)
සහ ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබාගත් පසු අදාල ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

06. පහත සඳහන් ලියකියවිලි සියල්ලේම තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය (සැ.යු. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ).
(ii) උපාධි සහතික හෝ අනෙකුත් අධ්‍යාපන සහතික;
(iii) වෘත්තීය සහ/හෝ තාක්ෂණික සුදුසුකම් දැක්වෙන සහතික;
(iv) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

07. රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

08. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II 'අ') වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 1986.08.15 දිනැති අංක 415 දරන *ගැසට් පත්‍රයේ* සාමාන්‍ය 1 කොටස යටතේ ප්‍රකාශයට පත්කරන ලද "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය" කෙරෙහි ද අපේක්ෂකයින් ගේ අවධානය යොමු කරවනු ලැබේ.

09. සියලුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | | |
|---|---|---|
| I. | සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය | ලකුණු 100 යි. පැය එකක ප්‍රශ්න පත්‍රයකි. |
| II. | බුද්ධි පරීක්ෂණය | ලකුණු 100 යි. පැය එකක ප්‍රශ්න පත්‍රයකි. |

තරඟ විභාගයේ කුසලතාවය අනු පිළිවෙල අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.) එක් එක් විෂයයේ ලකුණු 40% හෝ ඊට වැඩිය ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුව ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ලැබේ.

10. *නිර්දේශ පත්‍රය -*

10.1 *සාමාන්‍ය දැනුම - පැය 1 යි (එකයි)*

අපේක්ෂකයා තුළ ඇති ආර්ථික, සාමාජීය, දේශපාලනික, භූගෝලීය හා භූ විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපෙක්ෂකයා තුළ ඇති දැනුම පිරික්සීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇති අතර, එම ප්‍රශ්න පත්‍රයේ සමහර ප්‍රශ්න කෙළින්ම අපේක්ෂකයා වෙත ඉදිරිපත් කර එයට නිවැරදි පිළිතුරු බලාපොරොත්තු වන ආකාරයටත්, තවත් සමහර ප්‍රශ්න අපේක්ෂකයා වෙත ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කර එයින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම පිළිබඳ අපේක්ෂකයාට ඇති හැකියාව පරීක්ෂා කිරීම සඳහාත් සකස් කර ඇත.

10.2 *බුද්ධි පරීක්ෂණය - පැය 1 (එකයි)*

පැය එකකට සීමා වන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ, අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය හා ඔහුගේ තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහාය,
මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට සකස් කොට ඇත.

11. *විභාග දිනය* .- මෙම විභාගය 2009 අප්‍රේල් මස අවසානයේ කොළඹ නගරයේ දී (නගර අංක 01) හා යාපනය නගරයේ දී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම්ට බලය ඇත. මේ අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය නිවැරදිව ඉල්ලුම්පත්‍රයේ අදාල ස්ථානයේ සටහන් කරන්න. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩදෙනු නොලැබේ.

12. *විභාග ගාස්තු* .- විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකුව නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001-39026228 ගිණුමට මුදල් බැර කර ලබා ගත් ලදු පත ඉල්ලුම් පත්‍රයේ අදාල කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. විවෘත තරග විභාගයේ අනු පිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අපේක්ෂකයින් පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

14. පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ල හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 ඡේදයන්හි වගන්ති තනතුරට ගැලපෙන පරිදි අදාල වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

තිලක් හපන්ගම,
ලේකම්,
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය.

2009
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය*

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) තනතුරු**

| ඉල්ලුම්කරන තනතුරු අංක කැමැත්තේ අනුපිළිවෙල අනුව | තනතුරු |
|---|---|
| | |

1.0 භාෂා මාධ්‍ය:
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය ☐
සිංහල-2, දෙමළ-3, ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

2.0 නගරය: ☐
විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය

| එම නගර අංකය | |
|---|---|
| | |

(විභාග නිවේදනයේ 1 වන ඡේදයට අනුව)
නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

01. නම (මුලකුරු සමග) :

උදාහරණ : SILVA A. B.

02. සම්පූර්ණ නම :

03. රාජකාරී ලිපිනය :

04. පෞද්ගලික ලිපිනය:

05. (අ) ශ්‍රී ලාංකිකයෙකුද යන වග :

(ආ) එසේ නම් පරම්පාරාවෙන්ද ලියාපදිංචි වීමෙන්ද යන වග :

06. (අ) උපන් දිනය:

වර්ෂය: මාසය: දිනය:

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය:

07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: මාස : දින :

08. විවාහක/අවිවාහක බව :——————.

09. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(අ) තනතුර හා පත්වීමේ දිනය :——————,
(ආ) තනතුර ස්ථිරද තාවකාලිකද යන වග :——————,
(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිතද යන වග :——————,
(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත්ද යන වග :——————,
(ඉ) දෙපාර්තමේන්තුව :——————,
(ඊ) ආයතනය/සේවා ස්ථානය :——————,
(උ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය :——————,
(ඌ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :——————.

10. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ භාෂාවෙහි ප්‍රවීණතාවය පිළිබඳ සහතිකද ඇතුළුව)

| *විභාගය* | *විශ්ව විද්‍යාලය/ආයතනය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

11. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| *සහතිකය* | *සහතිකය නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

12. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | |

13. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | |

14. කලින් දරන ලද තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | තනතුර ස්ථිරද තාවකාලිකද යන වග | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | | |

15. ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේද? එසේ නම් විස්තර දක්වන්න :——————.

16. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න. :——————.

17. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේද? එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න :——.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇති බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසියම් වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:————————,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————————,

03-158

**සංශෝධනයයි**

2008.12.26 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ IV ශ්‍රේණියේ සමෘද්ධි කළමණාකරුවන් V වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගයට අදාල අයදුම්පත්‍ර කැඳවීමේ නිවේදනයේ 2.3 ඡේදයෙහි "ආයතන සංග්‍රහ හා මුදල් රෙගුලාසිවල තෝරාගත් පරිච්ඡේදයක්" යන්න දක්වා ඇත.

'එම තෝරාගත් පරිච්ඡේද' යන්නට පහත සංශෝධන ඇතුළත් විය යුතුය:-

| | | |
|---|---|---|
| * | ආයතන සංග්‍රහයේ | I, II, III, IV, VII, XII, XIV, XV, XXV පරිච්ඡේද |
| * | මුදල් රෙගුලාසි | I, II, III, XIII පරිච්ඡේද |
| * | *தாபனக் கோவை* | *பந்தி* I, II, III, IV, VII, XII, XIV, XV, *மற்றும்* XXV |
| * | *நிதிப் பிரமாணம்* | *பந்தி* I, II, III, *மற்றும்* XIII |
| * | Establishment Code - | Chapters I, II, III, IV, VII, XII, XIV, XV and XXV |
| * | Financial Regulations - | Chapers I, II, III and XIII |

ඉන්ද්‍රානි පල්ලියගුරු,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

03-60

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I II සහ III ඡේද තුන ම ඇතුළත් ව) | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස | 580 00 | 3,120 00 |
| III වැනි කොටස | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) | 890 00 | 2,400 00 |
| V වැනි කොටස | 860 00 | 420 00 |
| VI වැනි කොටස | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) | 25 00 | 60 00 |
| III වැනි ඡේදය | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I II සහ III ඡේද තුන ම ඇතුළත් ව) | 80 00 | 120 00 |
| II වැනි කොටස | 12 00 | 60 00 |
| III වැනි කොටස | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) | 23 00 | 60 00 |
| V වැනි කොටස | 123 00 | 60 00 |
| VI වැනි කොටස | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| මාර්තු | 2009.03.06 | සිකුරාදා | 2009.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.13 | සිකුරාදා | 2009.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.20 | සිකුරාදා | 2009.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.27 | සිකුරාදා | 2009.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2009.04.03 | සිකුරාදා | 2008.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.08 | බදාදා | 2008.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.17 | සිකුරාදා | 2009.04.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.24 | සිකුරාදා | 2009.04.08 | බදාදා | දහවල් | 12.00 |
| | 2009.04.30 | බ්‍රහස්පතින්දා | 2009.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2009.05.07 | බ්‍රහස්පතින්දා | 2009.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.15 | සිකුරාදා | 2009.04.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.22 | සිකුරාදා | 2009.05.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.29 | සිකුරාදා | 2009.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.